# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

## 1. ප්‍රධාන කළමනාකරු (අලෙවි හා ව්‍යාපාර සංවර්ධන) තනතුර - ජ්‍යෙෂ්ඨ තලයේ කළමනාකරණ 1 (SLM1)

### අ.) යෝග්‍යතාවය

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය / අලෙවිකරණය / කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයක අලෙවිකරණයෙහි සාමාජිකත්වය.

සමග

පිළිගත් සංවිධානයක අලෙවිකරණය හා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වයේ අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අලෙවිකරණ සංවර්ධනයෙහි සියලු අංශයන් පිළිබඳ පුළුල් දැනුම සමග අලෙවිකරණය, සැපයුම්, සමූද්‍රීය ආර්ථික හා සැපයුම් දම කළමනාකරණය පිළිබඳ උසස් නිපුණතා සහිත අය විය යුතුය.

වරාය, නාවික හා සැපයුම් සම්බන්ධ අලෙවිකරණය හා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම අයදුම්කරුවන්ට නිශ්චිත වාසියක් වනු ඇත.

### ආ.) විවේතන

| | |
|---|---|
| වැටුප් ප්‍රභේදය | : 3:1 (SLM1) |
| මූලික වැටුප | : රු. 105,765/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : දළ වැටුප සියලූ දීමනා ඇතුළු ආසන්න වශයෙන් රු. 182,100/- (මාසිකව) |

## 2. ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති) තනතුර - ජ්‍යෙෂ්ඨ තලයේ කළමනාකරණ (SLM1)

### අ.) යෝග්‍යතාවය

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්‍ෂණය (IT) පිළිබඳ පශ්චාත් උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු තාක්‍ෂණයෙහි සාමාජිකත්වය.

සමග

පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වයේ අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

පද්ධති, යෙදවුම් හා තාක්‍ෂණයන් පිළිබඳ නවීනතම දැනුම ඇතුළුව පද්ධති සැළසුම්, සංවර්ධනය, ව්‍යාපෘති කළමනාකරණය සහ අධි සංකීර්ණ තොරතුරු පද්ධතීන්හි සියලූ අංගයන් පිළිබඳ උසස් තාක්‍ෂණ දැනුම සහිත අය විය යුතුය.

### ආ.) විවේතන

| | |
|---|---|
| වැටුප් ප්‍රභේදය | : 3:1 (SLM1) |
| මූලික වැටුප | : රු. 105,765/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 1,900/- |

දළ වැටුප සියලූ දීමනා ඇතුළු ආසන්න වශයෙන් රු. 182,000/- (මාසිකව)

**වයස් සීමාව :**

ඉහත තනතුරු සඳහා අයදුම්කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

(රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් දැනටමත් ක්‍රියාත්මක වන සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන කොන්දේසි හා නියමයන් අනුගමනය කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාවය පරිදි අධිකාරියේ ඕනෑම අංශයක හෝ කොට්ඨාසයක සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම අවශ්‍ය වේ.

වයස, අධ්‍යාපනික, වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත් සමග අයදුම්පත් 2020-04-01 දින හෝ ඊට පෙර, " කොළඹ - 13 කොච්චිකඩේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ. මානව සම්පත් අංශයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු" වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නැතහොත් slpahrex@slpa.lk විද්‍යුත් තැපැල මගින් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අදාළ සහතික පිටපත් අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

වැඩි විස්තර සඳහා මෙම නිවේදනය www.slpa.lk වෙබ් අඩවියෙහි පළකර ඇත.

රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. තෝරා ගනු ලබන විටදී අදාළ දෙපාර්තමේන්තු / සංස්ථාවලින් අයදුම්කරුවන් නිදහස් විය යුතුය.

**සභාපති**